**කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2015 මාර්තු 25 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 17 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගොස්තු 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මැයි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබූ අතර, රු.500,000 ක ඇස්තමේන්තුගත මුදල ගිණුම්වලට ගෙන තිබුණි.

(ආ) 2014 වර්ෂයේ කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වීදි පහන් කට්ටල 30 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ඉපලෝගම ජල ව්‍යාපෘතියෙහි හිඟ ජල බදු ප්‍රමාණය රු.270,905 කින් අඩුවෙන් දක්වා තිබීම නිසා එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ගිණුම්වල වටිනාකම සහ අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්
-------------------------

ගිණුම් විෂයයන් 02 කට අදාළව උපයෝගී ලේඛනවල පැවති ශේෂයන් සහ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂයන් අතර, රු.275,876 ක වෙනසක් පැවතුණි.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.24,306,134 ක් හා ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.24,775,207 ක් විය.

### 1.3.4 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2) (අ) සහ (ඊ) වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු ආදායම් විධිමත් පරිදි අයකර ගැනීමට පියවර ගෙන නොතිබු අතර 150 වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ ඇති ව්‍යාපාරික ස්ථානවලින් බලපත්‍ර ගාස්තු නොගෙවා පැහැර හරින තැනැත්තන් සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය පියවර ගෙන නොතිබුණි. තවද පනතේ 158 වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ වරිපනම් හා අක්කර බදු නොගෙවා පැහැර හරින තැනැත්තන්ට අයත් චංචල දේපල තහනමට ගෙන හිඟ මුදල් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,935,974 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,245,205 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුළ ලැබී තිබුණ පිළිවෙලින් රු.12,922,423 ක් හා රු.7,229,051ක් වූ මූලධන ආධාර හා සමාලෝචිත වර්ෂයේ රු.14,183,871 ක් හා ඉකුත් වර්ෂයේ රු.10,081,320 ක් වූ මූලධන වියදම් ගණන් බැලීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.3,674,526 ක් වී තිබුණු අතර ඉකුත් වර්ෂයේ රු.607,064 ක ඌනතාවයක් ඇතිවී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,281,590 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ගිණුම්වලට අනුව කාරක ප්‍රාග්ධන අනුපාතය (ජංගම වත්කම් : ජංගම වගකීම්) 1.46 : 1 ක් විය. ඊට පෙර වර්ෂයේ දී එය 1.36 : 1 ක් විය.

## 2.3 ආදායම් පරිපාලනය

## 2.3.1 ආදායම් රැස්කිරිමේ කාර්ය සාධනය

**සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ආදායම් රැස්කිරිමේ ප්‍රගතිය පහත දැක්වේ.**

| ආදායම් විෂයය | 2014 ඇස්තමේන්තුගත | 2014 තථ්‍ය | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2013 ඇස්තමේන්තුගත | 2013 තථ්‍ය | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' |
| වරිපනම් | 200 | 143 | 57 | 200 | 149 | 51 |
| කුලී | 588 | 553 | 35 | 634 | 631 | 03 |
| බලපත්‍ර ගාස්තු | 805 | 660 | 145 | 595 | 521 | 74 |
| සේවා සඳහා ගාස්තු | 669 | 1,266 | (597) | 657 | 1,183 | (506) |
| ජල බදු - කරුවලගස්වැව | 594 | 578 | 16 | - | - | - |
| තොග ජල ව්‍යාපාතිය | 169 | 134 | 35 | - | - | - |

## 2.3.2 වරිපනම් බදු හා කුලී

(අ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල්කල මුදලින් අයකර ගැනීම් සියයට 72 ක් වු අතර, 2014 වර්ෂය ආරම්භයේ රු.81,900 ක හිඟ කුලී අයවීමට තිබුණද, එයින් රු.44,300ක් අයකර ගෙන තිබු අතර, වර්ෂය අවසානයට රු.72,300 ක් අයවීම හිඟ හිට තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වාහන 09 කට රු.1,651,521ක ඉන්ධන වියදමක් සහා ආදායමෙන් වැයකර තිබුණද, ඒවායේ ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

2014 වර්ෂයට අදාලව මුද්දර ගාස්තු සහ උසාවි දඩ වෙනුවෙන් ලැබිය යුතු මුදලින් කොටසක් පමණක් අයකර ගෙන තිබු අතර, ලැබිය යුතු මුදල් ලෙස වාර්ෂික අයවැයෙහි ඇස්තමේන්තුගත මුදල ගිණුම්ගත කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මානව සම්පත් කළමනාකරණය

සභාවේ ලේකම් තනතුර වසර කිහිපයක සිට පුරප්පාඩුව පැවති අතර, ද්විතික ශ්‍රේණියේ තනතුරු 11 කද, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 04 කද පුරප්පාඩු පැවතුණි. වැඩ පරීක්ෂක, මුරකරු සහ ජල නළ කාර්මික යන තනතුරු සඳහා මාසික හා දෛනික දීමනා මත අනියම් පදනමින් සේවකයින් තුන්දෙනෙකු බඳවාගෙන වැටුප් ගෙවා තිබුණි.

### 3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

රු.1,319,050 ක් වටිනා අංක WP LE – 7454 දරන මහේන්ද්‍රා සිංගල් කැබ් රථය හා වටිනාකම් ගණනය නොකරන ලද නළ ළිං උපකරණ කාලයක් තිස්සේ නිෂ්ක්‍රීයව සභා භූමිය තුළ රඳවා තිබූ අතර, සභාව සතු රු.1,678,223 ක් වටිනා ගොඩනැගිලි 3 ක්, වටිනාකම ගණනය නොකළ ගොඩනැගිල්ලක්, රු.155,000 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ සහ වටිනාකම ආගණනය නොකළ වාහන 4 ක් ප්‍රයෝජනයට නොගෙන සභා භූමියේ ගාල්කර තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 82.8 රීතිය ප්‍රකාරව සභාවේ අභ්‍යන්තර විගණන සැළැස්ම, සමාලෝචිත වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) වාහන පාලනය
(ඇ) ආදායම් පරිපාලනය